# සංවර්ධන සන්නිවේදනය නිසියාකාර ව සන්නිවේදනය වූවා ද - ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජයේ සංවර්ධන සන්නිවේදන විකාශනය පිළිබඳ මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ඇසුරෙන් කළ අධ්‍යයනයක්

*ඒ.එම්.ජී. කසුන් සමීර මීගස්තැන්න*[1]

සංවර්ධනය උදෙසා සන්නිවේදනය භාවිත කිරීම "සංවර්ධන සන්නිවේදනයයි". මෙරට ආරම්භ කළ සෑම ව්‍යාපෘතියක ම එහි සංවර්ධන සන්නිවේදනය නිසි පරිදි සිදු වුවා ද යන්න ගැටලුවකි. ඒ පිළිබඳ මෙම අධ්‍යයනය තුළින් අධ්‍යනය කරයි. මෙරට 1977න් පසුව විවෘත ආර්ථිකයත් සමග විශාල සංවර්ධන ව්‍යාපෘති රාශියක් මගින් සංවර්ධනය ක්‍රියාත්මක කළ අතර ඒ සෑම ව්‍යාපෘතියකින් ම ග්‍රාමීය ජනතාව වෙත සන්නිවේදනයක් සිදු කෙරිණි. ඒ අතර ජල විදුලිය ලබා ගනිමින් රට ම විදුලි ආලෝකයෙන් බැබළවීමට කටයුතු කරන බව ජනතාවට සන්නිවේදනය කිරීම සිදු වුව ද ඒ තුළින් නිවරදි ව සංවර්ධන සන්නිවේදනය සිදු වුවා ද යන්න ගැටලුවක් වන්නේ අදටත් විදුලිය නොමැති පිරිසක් රටෙහි ග්‍රාමීය ව ජීවත් වන බැවිනි. මෙරට කඩිනම් මහවැලි ව්‍යාපෘතිය යටතේ ආරම්භ කළ ජල විදුලිය නිෂ්පාදන ව්‍යාපෘති පිළිබද හා එහි සංවර්ධනය පිළිබඳ ව ජනතාව වෙත සන්නිවේදනය කරන ලදදේ සමස්ත ශ්‍රී ලංකාවට ම විදුලි බලය ලබා දී අතිරික්තය ඉන්දියාවට අපනයනය කරන බවත් ය. එසේ පවසමින් ආරම්භ කළ ව්‍යාපෘතිවල නිසි පරිදි අරමුණ පණිවිඩයක් ලෙසින් ග්‍රාමීය ප්‍රජාව වෙත සන්නිවේදනය වුවා නම් අදටත් ශ්‍රී ලාංකීය ග්‍රාමීය ජනයා කුප්පි ලාම්පුවෙන් විදුලි අවශ්‍යතාව සපුරාලීමට අවශ්‍ය නො වේ. ජනතාවට සන්නිවේදනය වූ පණිවිඩයට හාත්පසින් ම වෙනස් අරමුණක් මෙම ව්‍යාපෘතින්හි තිබූ බව නිරීක්ෂණය විය. එනම් ජනනය කිරීමෙන් ලබාගන්නා ජල විදුලි බලය විවෘත ආර්ථිකය හමුවේ මෙරට කර්මාන්ත ආරම්භ කළ ආයෝජකයන්ට අවශ්‍යය විදුලිය එම කර්මාන්ත පිහිටි රත්මලාන, කටුනායක ආයෝජන කලාපය වෙත ලබා දීම එහි අරමුණ වූ බව නිරීක්ෂණය විය. මෙම පර්යේෂණයෙහි ලා ප්‍රාස්තුත අධ්‍යයන ක්‍රමවේදය වසයෙන් ගුණාත්මක දත්ත රැස් කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීක සාහිත්‍ය හා මාර්ගගත මූලාශ්‍රය අධ්‍යයනය කළ අතර පුස්තකාල හා ඒ පිළිබඳ රූපරාමු අධ්‍යයනයෙන් දත්ත රැස් කර ගන්නා ලදි. මෙම පර්යේෂණය තුළින් සංවර්ධන සන්නිවේදනය නිසි පරිදි ග්‍රාමීය ප්‍රජාව වෙත සන්නිවේදනය වුවා ද යන්න අධ්‍යයනය කරන ලද අතර එහි දී පැහැදිලි වූයේ මෙරට බෝහෝමයක් සංවර්ධන ව්‍යාපාතීන්හි නිසි අරමුණු ජනතාව වෙත සන්නිවේදනය නොවූ බවත් ය. එනම් ග්‍රාමීය ජනයා වෙත සංවර්ධනය මුවාවෙන් වැරදි පණිවිඩයන් සන්නිවේදනය තුළින් සංවර්ධන සන්නිවේදන තුළ සංවර්ධනයේ මුවාවෙන් නිසි පරිදි සන්නිවේදනය නොකළ බවයි. අවසාන වසයෙන් සංවර්ධන සන්නිවේදය තුළ ගත යුතු පියවර ලෙස සෑම ව්‍යාපෘතියකට ම පෙර ජනතාව වෙත එහි ප්‍රතිලාභවල සිට අවසානය දක්වා සැලැස්ම පිළිබඳ නිසි සන්නිවේදනයක් සිදු කළ යුතු බව මෙම පර්යේෂණය තුළින් පෙන්වා දි ඇත.

***ප්‍රමුඛ පදඃ*** සංවර්ධන සන්නිවේදනය, ග්‍රාමීය සමාජයෙ, ව්‍යාපෘති, ප්‍රජාව, සංවර්ධනය

[1] සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. kksameera12@gmail.com